# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

# කැලණිය විශ්වවිද්‍යාලය

# *වාර්ෂික වාර්තාව - 2017*



## දැක්ම

**පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ලෝකයේ විශිෂ්ටතම පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම**

## මෙහෙවර

**පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ කුශලතා වර්ධනය කිරීම සඳහා විද්‍යාර්ථීන්ට උපරිම අවස්ථා හා පහසුකම් සැපයීමේ විශිෂ්ටත්වයට ළඟාවීම**

# අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ පණිවුඩය



කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය වසර තිස් හතක කාලයක් පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව හැදෑරීමට රිසි විද්‍යාර්ථීන් වෙනුවෙන් අධ්‍යයන පහසුව සලසන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වේ.

ඉතා අවම පහසුකම් යටතේ ක්‍රියාත්මකව පැවති ආයතනය මම අධ්‍යක්ෂ ධූරයේ වගකීම භාර ගැනීමෙන් පසු වඩාත් ඉඩකඩ ඇති වර්තමාන ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කර නවමං ඔස්සේ අධ්‍යයන සැලසුම් ක්‍රියාත්මක කිරිමට උත්සුක වීමි. අධ්‍යයන ක්ෂේත්‍රයේ මෙන් ම පරිපාලන අනධ්‍යයන හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වගකීම් මැනවින් අවබෝධ කරගත් අතර සියලු පාර්ශ්ව සමඟ සහයෝගයෙන් විශිෂ්ටත්වය කරා ගමන් ඇරඹීමි.

එම උත්සාහය මල්ඵල ගන්වමින් වර්තමානය වන විට දේශීය විදේශීය ශිෂ්‍ය ප්‍රජාවට බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන පහසුකම් සලසමින් ශ්‍රී ලංකාව තුළ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවකට බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන දායකත්වය සලසන ආයතනය බවට පත් කර ගැනීමට ලැබීම බෙහෙවින් ම සතුටුදායක කාරණයකි. ශාස්ත්‍රීය සමාජීය හා සංස්කෘතික මෙහෙවර ද දේශීයව පූරණය කිරීමට දායක වෙමින් ථෙරවාදී සම්ප්‍රදායේ අධ්‍යයන කටයුතු සිදු කරන ලොව ප්‍රමුඛතම පශ්චාත් උපාධි ආයතනය ලෙස මෙම ආයතනය ක්‍රියාත්මක වීමද මහත් වූ අභිමානයක් ලෙස සලකමි.

මෙම ආයතනයෙන් අධ්‍යාපනය ලැබූ දෙස් විදෙස් විද්‍යාර්ථීන් සුපුෂ්පිත චින්තනයකින් පෝෂිත වියත්හු ලෙස ජාතික හා ජාත්‍යන්තර මෙහෙවරහි යෙදී බුදු දහමේ යශෝකීර්තිය ලොවැපුරා විහිදැවීමට පුළුල් ලෙස දායක වෙති. එමෙන් ම ශ්‍රී ලංකාවෙන් ලබාදිය හැකි උතුම්ම දායාදය ලෙස ථෙරවාදී බුදු දහම ලොවට දායාද කරමින් සිංගප්පූරුව, හොංකොං හා චීනය වැනි රටවල අනුබද්ධ ආයතන ක්‍රියාත්මක කරමින් මෙම ආයතනය අන්තර් ජාතික මට්ටමේ සුවිශේෂී ආයතනයක් බවට පත් කරන්නට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි.

2017 වසර වන විට ආයතනයේ සන්ධිය මංසලකුණු විද්‍යාමාන කරමින් ස්ථිර භූමිභාගයක ගොඩනැගිලි සංකීර්ණයක් නිවහන කර ගැන්මේ කටයුතුවල ආරම්භය සනිටුහන් වීම මාගේ පරම වූ ආයතනික අරමුණක් සඵල කර ගැනීමක් මෙන් ම ආයතනයේ සමස්ත ප්‍රයත්නය යථාර්ථයක් වීමක් ලෙස ද දකිමි.

තෙරුවන් සරණයි.

මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනාහිමි
අධ්‍යක්ෂ
2017.12.31

## පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 2 - 6 |
| කළමනාකාර මණ්ඩලය | 7 |
| පීඨසභාව | 8 |
| විගණන කමිටුව | 9 |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | 10 |
| කාර්ය මණ්ඩල විස්තර | 11 |
| පාඨමාලා විස්තර | 12 |
| ශිෂ්‍ය තොරතුරු | 13 - 19 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි | 20 |
| ප්‍රකාශන, පුස්තකාලය සහ පර්යේෂණ ඒකකය | 21 - 22 |
| අධ්‍යයන චාරිකාව හා සම්මන්ත්‍රණ | 23 |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | 24 - 30 |
| වාර්තාව සඳහා අදාළ වෙනත් කරුණු | 31 |
| අවසාන ගිණුම් 2017 | 32 |

# 01. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය 1975 වර්ෂයේ ආරම්භ කරන ලදුව, 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවත්වා ගෙන යනු ලැබේ. ආයතනයේ ශාස්ත්‍රීය හා පරිපාලන ව්‍යුහය කළමනාකාර මණ්ඩලය විසින් නියාමනය කෙරේ. පශ්චාත් උපාධි පාඨමාලා සංවර්ධනය, අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම, පර්යේෂණ කටයුතු මෙන් ම පරීක්ෂණ කටයුතු ද ආයතනයේ පීඨසභාව, කළමනාකාර මණ්ඩලය මගින් කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව හා පාලක සභා අනුමැතිය මත සිදු කරනු ලැබේ. අධ්‍යයනාංශ වශයෙන් බෞද්ධ මූලාශ්‍රය, බෞද්ධ දර්ශනය හා බෞද්ධ සංස්කෘතිය වශයෙන් ක්‍රියාත්මකය. පරිපාලන ව්‍යුහය, මෙන් ම පුස්තකාලය හා පර්යේෂණ ඒකකය ද ආයතනයේ වැදගත් අංශ අතරට එක් වේ.

අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිංහල හා ඉංග්‍රීසි භාෂාද්වයෙන් පවත්වනු ලබන අතර දේශීය විදේශීය විද්‍යාර්ථීන් සඳහා විවෘතව ඇති මෙම ආයතනය දැනට ජාතික මට්ටමින් මෙන් ම ජාත්‍යන්තරව බුදු දහම සන්නිවේදනය කිරීමට මූලිකව ක්‍රියා කරනු ලැබේ. පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාව යටතේ දෙස් විදෙස් විද්‍යාර්ථීන් දහස් ගණනකට මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි පිරිනමා ඇත. එමඟින් ආයතනය විසින් ශාස්ත්‍රීය ලෝකයට දායාද කළ කීර්තිමත් විද්වතුන් ශාස්ත්‍රීය ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල නියැලෙමින් ජාතික මෙහෙවරක යෙදී සිටීම ආයතනයට මෙන් ම ශ්‍රී ලංකාවට ද අභිමානයකි.

ජාතිකව හා ජාත්‍යන්තරව පිළිගත් කීර්තිමත් විද්වතුන්ගෙන් සැදුම්ලත් අභ්‍යන්තර හා බාහිර ආචාර්ය මණ්ඩලය ආයතනික පාඨමාලාවල සම්පත් දායකයන් ලෙස කටයුතු කිරීම ද ආයතනයේ ආදි විද්‍යාර්ථීන් විසින් විදේශ රටවල මෙම ආයතනයට අනුබද්ධ ආයතන මෙහෙයවීම ද ආයතනික ශාස්ත්‍රීය දායකත්වයට කදිම සාධක වේ. දේශීය වශයෙන් ශාස්ත්‍රීය, සමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රවල ප්‍රගමනයට දායකත්වය සපයමින් ආයතනය සමාජ මෙහෙවරෙහිද යෙදෙන ආයතනයකි.

විවිධ දිශානති ඔස්සේ බුදු දහමේ හරය විහිදුවාලමින් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය, බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධිය, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය හා බෞද්ධ අධ්‍යයන දර්ශනපති හා දර්ශනසූරී පාඨමාලා වශයෙන් වර්ෂය පුරාවට පවත්වනු ලැබේ. තරහකාරී ජාතික මෙහෙවරක යෙදෙන මෙම ආයතනය දැනට ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය විද්‍යාර්ථීන් සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙන ලොවැ පුමුඛතම ආයතනය බව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ විශ්වවිද්‍යාලවල ශ්‍රේණිගත කිරීම සහ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල යටතේ වර්ගීකරණය විම අභිමානයෙන් සඳහන් කළ යුතුව ඇත.

ආයතනය ආරම්භ කරමින් පළමු අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ කීර්තිමත් පැවිදි පඬිරුවනක් වූ ආචාර්ය හැවැන්පොළ රතනසාර නාහිමියන් (1978-1979) විසින් ඇරඹූ ගමන් මඟෙහි ; බෞද්ධ සමාජයෙහි බුහුමනට පාත්‍ර වූ මහාචාර්ය එල්.පී.එන් පෙරේරා මහතා (1979-1984), මහාචාර්ය ජෝතිය ධීරසේකර මහතා (1984-1990), මහාචාර්ය වයි. කරුණාදාස මහතා (1991-2000), මහාචාර්ය තිලක් කාරියවසම් මහතා (2000-2003), මහාචාර්ය අසංග තිලකරත්න මහතා (2003-2007) හා මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා (2007-2013) යන ගිහි පැවිදි විද්වතුන් ආයතනයේ ගමන් මඟ දිප්තිමත් කරමින් යුග මෙහෙවරක යෙදුනාහ. මහාචාර්ය

කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන් වහන්සේ වර්තමානයේ අධ්‍යක්‍ෂ තනතුර හොබවමින් නව මං ඔස්සේ ආයතනයේ නිම් වළලු තවදුරටත් පුළුල් කරන්නට දිරිමත් විම පැසසුමට ලක් කළ යුතු කාරණයකි.

අතීතයේ ඇරඹි තිරසාර පදනමේ සවිමත් බව මැනවින් ප්‍රකට කරමින් ආයතනය ජාත්‍යන්තර සබඳතා ගොඩනඟමින් අනුබද්ධ ආයතනය පවත්වා ගනිමින් ඒවායේ අධ්‍යාපනය නියාමනය කරනුයේ බුදුදහම එම රටවල ජනතාවගේ සන්තානය සුවපත් කරන්නට මාහැඟි දායාදයක් බව පසක් කරමිනි. අධ්‍යයන කටයුතුවල නියැලී සිටින විද්‍යාර්ථීන් සිංගප්පූරුවේ The Buddhist Library Graduate School, හොංකොංහි The Buddha-Dharma Centre of Hong Kong Limited හා චීනයේ The China’s Buddhist Academy of Mt.Putuoආයතනය වෙත පැමිණෙනුයේ බුදු දහමේ අන්තර්ගතය සිය ජීවිතයට සමීප කැර ගැන්මේ අභිලාෂය පෙරදැරි කර ගෙන බව ඒවායේ ප්‍රතිපෝෂණ වාර්තා මගින් මැනවින් පැහැදිලි කරනු ලැබේ.

සමස්තයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය පසුගිය අනුගාමී වසර දෙක සඳහා ‘සත්‍ය හා සාධාරණ’ විගණන මතයකට ද හිමිකම් කියමින් ලෝකයේ ථෙරවාද සම්ප්‍රදායේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් වී ඇත. ආරම්භයේ සිට මේ දක්වා ආයතනික ගමන් මඟෙහි ප්‍රගමනයේ සන්ධිස්ථාන සලකුණු වීම ජාතික මෙහෙවරක උද්දාමය සනිටුහන් කරයි.

පශ්චාත් උපාධිලාභීන්ට උපාධි වාර්ෂිකව පිරිනමමින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මෙම ආයතනය ඉටු කරන මෙහෙවර තවදුරටත් ශක්තිමත් කර ආයනික චිරස්ථිතිය කහවුරු කිරීම සියලු දෙනාගේ අභිමානනීය ප්‍රාර්ථනය වේ.

# 02. ජයග්‍රහණ


පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ජාතික ජාත්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්‍ෂෙත්‍රයට අදාළ කටයුතු උසස් තත්ත්වයකට පත් කිරීමට මෙම ආයතනය සමත් වී ඇත. 2015 විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් ආයතන අතුරින් වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති ආයතනය බව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් නිකුත් වන 2015 වාර්ෂික වාර්තාවේ සඳහන් වේ.

2017 වර්ෂය අවසන් වන විට ස්ථිර භූමිභාගයක හිමිකම ලබා 2018 වර්ෂයේ නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීමට කටයුතු පූර්ණ වීම ආයතනයේ ඓතිහාසික සන්ධිස්ථානයක් ලෙස සටහන් වේ.

ආයතයේ දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති විවරණිකාව (Prospectus) නව මුහුණුවරකින් එළි දැක්වීම, ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම 2017 වසරේදී විශේෂිත කරුණු අතරට ගැනේ. දෙපාර්තමේන්තු කමිටු සක්‍රිය කර අධ්‍යයන කටයුතුවලට ලබා දෙන ශාස්ත්‍රීය දායකත්වය තවදුරටත් පුළුල් වීම ද ඉතා වැදගත් වේ.

## සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | දේශීය | විදේශීය | එකතුව |
|---|---|---|---|
| 1. 2013 | 186 | 134 | 320 |
| 2. 2014 | 285 | 128 | 413 |
| 3. 2015 | 146 | 165 | 311 |
| 4. 2016 | 154 | 261 | 415 |
| 5. 2017 | 152 | 300 | 452 |



## 03. පසුබැසීම් හා සාධාරණීකරණය

මෙම ආයතනයට වසර තිස් පහකට අධික ඉතිහාසයකට හිමිකම් ඇත. නේවාසිකාගාර ඇතුළු නවීන ඉඩපහසුකම්වලින් සේවා සැපයීමට හැකි වන්නේ නම් ශිෂ්‍ය ආකර්ෂණය තවදුරටත් ඉහළ නැංවිය හැකිය. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටලු ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාවේ වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන මෙම ආයතනයෙහි අවම පහසුකම් නොමැතිවීම හේතුවෙන් විදේශීය ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීමද සැලකිය යුත්තකි.

## 04. අනාගත සැලසුම්

1. ආයතනයට ලබා ගන්නා ඉඩම සඳහා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා සකස් කරමින් පවතී.
2. ආයතනය ජාත්‍යන්තරව දෙස් විදෙස් ආයතන සමඟ සම්බන්ධවීම.
3. නව පාඨමාලා හඳුන්වා දීම.
4. කාලීන වැදගත්කමින් යුතු එමෙන්ම ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයට අදාළ කරුණු සම්බන්ධයෙන් කතිකාවතක් සංවිධානය කිරිම හා එහි නිර්දේශ රජය වෙත භාරදීමට සැලසුම් කිරීම.
5. ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කර අඛණ්ඩව පවත්වාගෙන යාම.
6. ආයතනයේ විවරණිකාව (Prospectus) තවදුරටත් සැලසුම්ගත කිරීම.
7. කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
8. ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යයන වැඩ සටහන් සංවිධානය තවදුරටත් විධිමත් කිරීම.
9. ආයතනික පර්යේෂණ ප්‍රමාණය ඉහළ නැංවීම.

# 05. වෘත්තීය අවස්ථා

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සහ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාවට අදාළ පාඨමාලා පවත්වන ආයතන වේ. ඒ අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ වෘත්තීය අවස්ථා රාශියක් ශ්‍රී ලංකාවේ පවතී. මෙම ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද විද්‍යාර්ථීන්ගේ සහය එම ආයතනවලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

මෙම ආයතනයෙහි පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය විද්වතුන් රාශියක් උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරනු ලැබේ.

හොංකොංහි Buddha-Dhamma Centre ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ පූජ්‍ය මහාචාර්ය කේ.එල්. ධම්මජෝති හිමියෝ ද ථෙරවාද බෞද්ධ විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන ආචාර්ය කම්මායි ධම්මසාමි හිමියෝ ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය ලැබූ විද්වත්හු වෙති. චීනය, ජපානය හා එක්සත් රාජධානිය වැනි රටවල බොහෝ උසස් අධ්‍යාපන ආයතනවල මෙම ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සේවය කරන විශාල පිරිසක් සිටින බව සඳහන් කළ හැකිය. මේ අයුරින් සලකා බලන විට මෙම අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා විදේශීය පැවතීමද විශේෂත්වයකි.

තවද ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකු තම රැකියාවල උසස්වීම් සඳහා මෙහිදී පශ්චාත් උපාධි හදාරනු ලැබේ. එබැවින් රැකියා පිළිබඳ ගැටලුවක් මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් උද්ගත නොවේ.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
113, දුටුගැමුණු වීදිය,
කොහුවල.
2017.12.31

# 06. කළමනාකාර මණ්ඩලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 10 වන වගන්තිය යටතේ කළමනාකාර මණ්ඩලය මෙම ආයතනයේ විධායක මණ්ඩලය වේ. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

<u>නිල බලයෙන්</u>

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි - අධ්‍යක්ෂ (සභාපති)

2. පී.ජී. ජයසිංහ මහතා - උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ( 2017.07.06 තෙක්)
   එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න මහතා - 2017.10.12 සිට

3. තරණී අනෝජා ගමගේ මහත්මිය - සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා

<u>ආයතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්</u>

4. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි- අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය

5. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි -අධ්‍යයනාංශ ප්‍රධාන, බෞද්ධ සංස්කෘතියඅධ්‍යයනාංශය

6. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - අධ්‍යයනාංශ ප්‍රධාන,බෞද්ධ මූලාශ්‍රයඅධ්‍යයනාංශය

<u>කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>

7. ඩී.බී. විජේකෝන් මහතා

8. වෛද්‍ය නන්ද අමරසේකර මහතා

<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්</u>

9. මහාචාර්ය විමල්ජී. බලගල්ලේ මහතා

10. මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය

11. මහාචාර්ය දයා එදිරිසිංහ මහතා

12. සී. මාලියද්ද මහතා

<u>භාණ්ඩාගාර නියෝජිත</u>

13.ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>

14.එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
15.ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

# 07. පීඨසභාව

1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 13 වන වගන්තිය අනුව ආයතනයට පීඨසභාවක් තිබිය යුතු අතර එය ආයතනයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේය. එහි සාමාජික මණ්ඩලය මෙසේය.

<u>නිල බලයෙන්</u>

1. පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි - අධ්‍යක්ෂ (සභාපති)
2. මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි - බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන
3. මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඤාණ හිමි - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන
3. මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය අධ්‍යයනාංශ ප්‍රධාන

**කැලණිය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයනාංශ ප්‍රධානීන්**

5.පූජ්‍ය මහාචාර්ය කහපොල සුගතරතන නාහිමි (නියෝජිත - කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයන අංශය)

6.පූජ්‍ය මහාචාර්ය තැඹිලේ ධම්මරතන හිමි (කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශ ප්‍රධාන)

**ආයතනයේ එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරු**

7. මහාචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

8. පූජ්‍ය ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

9. ආචාර්ය අශෝක වැලිතොට මහතා - බෞද්ධදර්ශන අධ්‍යයනාංශය

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්**

10.පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි
11.පූජ්‍ය ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
12.මහාචාර්ය රත්න විජේතුංග මහතා
13. වෛද්‍ය අමරසිරි පොන්නම්පෙරුම මහතා
14. ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා

**කාර්යාලයීය උපස්ථිතියෙන්**

15. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
16. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

**ආරාධිත**

17.ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

# 08. විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (සභාපති)
   - මහා භාණ්ඩාගාර නියෝජිත

2. පී.ජී. ජයසිංහ මහතා - අතිරේක ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය) - 2017.05.25 තෙක්

   එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න මහතා 2017.10.27 සිට

3. මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ

4. එස්.එම්.එස්. සමරවීර මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

5. පත්මා අතුකෝරල මහත්මිය - විගණන අධිකාරී - රජයේ විගණන අංශය

6. එම්.එම්.ජේ.ආර්. බෝගමුව මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව

7. එල්.ඒ.සුමිත් ජයසේකර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - ලේකම්

<u>කාර්යාලයීය උපස්ථිතියෙන්</u>

8. ඒ.පී.එස්.එම්. දොළගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

9. ගීතානී අත්තනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

10. එම්.බී.වයි.ජී. පෙරේරා මහත්මිය - සහකාර ලේඛකාධිකාරී

# 09. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය

| | |
|---|---|
| 01. අධ්‍යක්ෂ | පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි<br>B.A. (Hons), M.A., PhD |
| 02. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | එල්.ඒ. සුමිත් ජයසේකර මහතා<br>B.A.(SJP)<br>PGD (UOC)<br>Dip. in Advanced English (UOC) |
| 03. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය<br>B.Sc. Business Admn(Sp) (SJP) |
| 04. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>BA. (Special),M.A.(Peradeniya)<br>MLSc. (Colombo) |
| 05. සහකාර ලේඛකාධිකාරී | එම්.බී.වයි.ජී. පෙරේරා මෙනෙවිය (2016.10.03 දින සිට)<br>B.Sc.Business Admn (Sp) (SJP)<br>M.A. (Econ)(Kelaniya) |

<u>අධ්‍යයනාංශ හා ප්‍රධානවරුන්</u>

| | |
|---|---|
| 06. බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි<br>M.A.(National University of Singapore) |
| 07. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය | මහාචාර්ය ඩබ්ලිව්.එම්. දේශප්‍රිය ගුණසේන මහතා<br>Doctor of Philosophy<br>M.A. (Linguistics) (SJP) |
| 08.බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි<br>MPhil. (Peradeniya) |

# 10.කාර්ය මණ්ඩල විස්තර - 2017

| පීඨය/අංශය | ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි | කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ - 01 | ලිපිකරු iii ශ්‍රේණිය - 01 | -- | |
| අධ්‍යයනාංශ<br>01. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය<br>02. බෞද්ධ චින්තන අධ්‍යයනාංශය<br>03. බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | - | ලිපිකරු iii ශ්‍රේණිය - 01 | | |
| ආයතන හා පාලන අංශය<br><br>පර්යේෂණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලඝුලේඛක-සිංහල)-01<br>ලිපිකරු iii ශ්‍රේණිය - 01<br>පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර - 01<br><br>විද්‍යාත්මක සහකාර i ශ්‍රේණිය - 01<br>විද්‍යාත්මක සහකාර - 01 | **කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු -** 01(ii ශ්‍රේණිය)<br><br>රියැදුරු ii ශ්‍රේණිය - 02 | කාර්යාල කාර්ය සහයක - 01<br><br>කම්කරු(විශේෂ ශ්‍රේණිය ) - 01<br>කම්කරු (iii ශ්‍රේණිය)- 01 |
| විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය | සහකාර ලේඛකාධිකාරී - 01 | පරිගණක යෙදවුම් සහකාර iii ශ්‍රේණිය -03 | | |
| ගිණුම් අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු) - 01<br>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) - 01<br>ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (සරප්) – 01<br>ගබඩා භාරකරු ii ශ්‍රේණිය - 01<br>පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර -01 | | කම්කරු (iii ශ්‍රේණිය) – 01 |
| පුස්තකාලය | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01 (i ශ්‍රේණිය) | පුස්තකාල සහකාර iii ශ්‍රේණිය - 01 | පුස්තකාල සේවක ii ශ්‍රේණිය - 02 | |

# 11. පාඨමාලා පිළිබඳ විස්තර

වර්තමානයේ පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන් ක්‍රියාත්මක වේ.

| Course ID | Course Name(English) | Course Name (Sinhala) |
|---|---|---|
| 01 | Postgraduate Diploma in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 02 | Master of Arts Degree in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 03 | Postgraduate Diploma in Pali Studies | |
| 04 | Master of Arts Degree in Pali Studies | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 05 | Master of Philosophy in Buddhist Studies(MPhil.) | බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය |
| 06 | Doctor of Philosophy in Buddhist Studies(PhD) | බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය |
| 07 | Postgraduate Diploma in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 08 | Master of Arts Degree in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව |
| 09 | Postgraduate Certificate Course in Pali | පාලි පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව |
| 10 | English Through Buddhism | |

# 12. ශිෂ්‍ය තොරතුරු - 2017

**සිංහල මාධ්‍යය**

| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 06 | 06 | 05 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 116 | 96 | 84 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 04 | 04 | 03 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 18 | 17 | 15 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 39 | 35 | 34 |

**ඉංග්‍රීසි මාධ්‍යය**


| පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ සංඛ්‍යාව | විභාගයට පෙනී සි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 28 | 25 | 23 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 251 | 250 | 226 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | 06 | 03 | 02 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංගප්පූරුව) | 02 | 02 | 02 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව(සිංගප්පූරුව) | 07 | 06 | 06 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (හොංකොං) පූර්ණකාලීන හා අර්ධකාලීන | 38 | 16 | 16 |
| ශාස්ත්‍රපති පාඨමාලව - චීනය | 13 | 13 | 10 |

**පර්යේෂණ උපාධි හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව**

| උපාධිය | සිංහල මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (MPhil.) | 66 | 73 |
| බෞද්ධ අධ්‍යයනද ර්ශන විශාරද උපාධිය (PhD) | 16 | 35 |


# 13. ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව - 2013 සිට 2017 වර්ෂය දක්වා

| පාඨමාලාවේ නම | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 12 | 11 | 10 | 13 | 06 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 12 | 229 | 28 | 26 | 28 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 12 | 125 | 73 | 91 | 126 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 194 | 175 | 186 | 264 | 275 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 15 | 12 | 04 | 04 | 05 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | - | - | - | - | 06 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 11 | 65 | 54 | 26 | 18 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 19 | 25 | 55 | 46 | 41 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව -සිංගප්පූරුව - අනුබද්ධ ආයතනය - The Buddhist Library Graduate School, Singapore | 05 | 08 | 07 | 10 | 02 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව -සිංගප්පූරුව - අනුබද්ධ ආයතනය - The Buddhist Library Graduate School, Singapore | 05 | - | 08 | 03 | 07 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - හොංකොං - The අනුබද්ධ ආයතනය - Buddha Dharma Centre of Hong Kong Ltd., | - | - | 18 | 43 | 10 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - මවුන්ට් පුටෝ ආයතනය අනුබද්ධ ආයතනය - The China's Buddhist Academy of Mount Putuo | - | - | - | - | 13 |
| English Through Buddhism Course | 115 | 104 | 126 | 174 | 115 |
| පාලි අධ්‍යයන පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | - | - | - | - | 24 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති (MPhil.) උපාධිය (සිංහල මාධ්‍යය) | 96 | 81 | 77 | 64 | 66 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති (MPhil.) උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 46 | 72 | 67 | 71 | 73 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (PhD) උපාධිය (සිංහල මාධ්‍යය) | 35 | 46 | 41 | 14 | 16 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (PhD) උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 26 | 38 | 30 | 34 | 35 |
| එකතුව | 603 | 991 | 784 | 883 | 866 |


ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව - 2013 සිට 2017 වර්ෂ දක්වා
700
600
500
400
300
200
100
0
දේශීය
විදේශීය
2013
2014
2015
2016
2017

# 14. සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | වර්ෂය | දේශීය | විදේශීය |
|---|---|---|---|
| 01 | 2013 | 186 | 134 |
| 02 | 2014 | 285 | 128 |
| 03 | 2015 | 146 | 165 |
| 04 | 2016 | 154 | 261 |
| 05 | 2017 | 152 | 300 |



# 15. මානව සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යාව - 2017

| පාඨමාලාව | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 06 | |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 26 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 116 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 251 | අධ්‍යක්ෂ<br>මහාචාර්ය - 04<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 02<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 04 | |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 18 | |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 39 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (සිංහල මාධ්‍යය) | 66 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 73 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (සිංහල මාධ්‍යය) | 16 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 35 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය) | 30 | |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර( ඉංග්‍රීසි මාධ්‍යය) | 02 | |

# 16. පාඨමාලා සම්පූර්ණ කළ දේශීය ශිෂ්‍යයෝ - 2017

| පාඨමාලාව | මාධ්‍යය | විභාගය සමත් (2016) | විභාගය සමත් (2017) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 11 | 05 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 02 | 24 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 75 | 86 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 09 | 265 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව<br>පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල<br>ඉංග්‍රීසි | 04 | 03<br>02 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 22 | 15 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 43 | 35 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | සිංහල | 01 | 04 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | 02 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | සිංහල | 06 | 04 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 07 |



# 17. පාඨමාලා සම්පූර්ණ කළ විදේශීය ශිෂ්‍යයෝ - 2017

| පාඨමාලාව | මාධ්‍යය | 2016 වර්ෂයේ විභාගයට පෙනී සිටි | 2017වර්ෂය ෙ විභාගයට පෙනී සිටි |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 22 | 20 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 212 | 245 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | 01 |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | -- | 04 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - බාහිර | ඉංග්‍රීසි | 10 | 02 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව - බාහිර | ඉංග්‍රීසි | 23 | 35 |

# 18. කුසලතා සම්මාන ප්‍රදාන

| විෂය | තිළිණ ප්‍රමාණය | ප්‍රදානය |
|---|---|---|
| (අ) දේශීය/ විදේශීය තිළිණ ලාභීන් | 01 | ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (ඉංග්‍රීසි) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) Ven. PannaTheri |
| | 01 | රජත මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සිංහල) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) |
| (ආ) ඊ.ඩබ්ලිව්.ගුණතිලක ශිෂ්‍යත්ව අරමුදල | 01 | පූජ්‍ය කැලණියේ සුධීරා සුධම්මචාරී මෙහෙණිය |
| (ඇ) මහායාන අධ්‍යයනයෙහි දක්ෂතා දක්වන සිසුන් සඳහා පිරිනමන ශිෂ්‍යත්ව | 02 | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සිංහල) පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) (ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ගාස්තු වලින් නිදහස් කිරීම) පූජ්‍ය කැලණියේ සුධීරා සුධම්මචාරී මෙහෙණිය |

# 19. අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2017

| දෙපාර්තමේන්තුව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය |
|---|---|---|---|---|---|
| බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - |
| බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශය | | - | 02 | - | - |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | | - | 01 | 01 | - |

# 20. 2017 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයා ගේ රට |
|---|---|---|---|
| **පූජ්‍ය ඌරුපැලැව්වේ හේමාරාම හිමි** | දර්ශන විශාරද (සිංහල) | බෞද්ධ විනයෙහි දැක්වෙන පුනරුත්ථාපන සංකල්පය හා එහි භාවිතය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| පී.එච්.ජී.ධර්මසිරි මහතා | දර්ශන විශාරද (සිංහල) | විනය සාහිත්‍යයන් හෙළිවන ආයතන සංවිධාන සංකල්පය පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| රණසිංහ ආරච්චිගේ රෝහණ ප්‍රිය සුසන්ත මහතා | දර්ශන විශාරද (සිංහල) | වනිතාවන්ගේ මනෝකායික ගැටලු නිරාකරණයෙහිලා භාවිතයට ගත හැකි බෞද්ධායුර්වේද ප්‍රතිකාර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |
| Ms. S.W. Samarawickrama | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | A Comparative Study of the Concept of Attendant (Nursing) in Buddhist Ayurvedic and Western Medical Tradition | ශ්‍රී ලංකාව |
| Ms. NalikaMallawathanthri | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | An Analytical Study of the Psychological Dimensions Reflected in the Biographies of the Pali Canon | ශ්‍රී ලංකාව |
| Ven. Chung Kwanyoo | දර්ශන විශාරද (ඉංග්‍රීසි) | An Analytical Study of the Dynamics of Craving (taṇhā) and Ignorance (avijiā) in the Process of Generating Suffering (dukkha) | කොරියාව |
| **කොළඹ මෝදර පරනපටබැඳිගේ ප්‍රියලාල් පෙරේරා පියතුමා** | දර්ශනපති (සිංහල) | ප්‍රජා සේවාව ආශ්‍රිත බෞද්ධ හා ක්‍රිස්තියානි ඉගැන්වීම් : තුලනාත්මක අධ්‍යයනයක් | ශ්‍රී ලංකාව |

# 21. ප්‍රකාශන

අන්වේෂණා- 2016 ප්‍රකාශයට පත් කිරීම.
ආයතනික හසුන්පත (News letter) ප්‍රකාශයට පත් කිරීම.

# 22. පුස්තකාලය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූලික මෙහෙවර වන්නේ බෞද්ධ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා සුදුසු අවස්ථා ඇති කර දීම හා ඒවාට උදව් කිරීම, බෞද්ධ අධ්‍යයන කෙරෙහි වඩාත් ඵලදායි ආකල්පයක් ඇති කිරීම හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ පර්යේෂණ නිපුණතා වැඩි දියුණු කිරීම වේ. මෙම මෙහෙවර සාධනය කර ගැනීමෙහි ලා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන විද්‍යාර්ථීන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට අවශ්‍ය ප්‍රාථමික හා ද්විතීයික තොරතුරු මූලාශ්‍රය සහ වෙනත් අදාළ පහසුකම් සැපයීම පුස්තකාලයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අතිරේකව බාහිර පුස්තකාල සාමාජිකත්වය යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයින්ට අවශ්‍ය විමර්ශන පහසුකම් ද පුස්තකාලය මගින් සැපයේ.

මේ වන විට ආයතන පුස්තකාලය සතුව ග්‍රන්ථ 22,000ක් පමණ තිබේ මේ අතරින් 90%ක් පමණ ම බෞද්ධ පොතපත වීම මෙහි දක්නට ලැබෙන සුවිශේෂතාවයකි.පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවන්ට හා බෞද්ධ පර්යේෂණ මාතෘකාවන්ට අනුගතවනසේ පුස්තකාල ද්‍රව්‍ය එක්රැස් කෙරේ.

ඒ නිසාම බුදුදහම සහ එහි ප්‍රභේදයන් කෙරෙහිත් පාලි භාෂාව, පාලි සාහිත්‍යය, බෞද්ධ කලා ශිල්ප, බෞද්ධ දර්ශනය ආදී විෂයයන් කෙරෙහිත් වැඩි අවධානයක් යොමු කර ග්‍රන්ථ අත්පත් කර ගනු ලැබේ. මීට අමතරව බුදුදහම හා සම්බන්ධ නව විශ්වකෝෂ, ශබ්ද කෝෂ ආදී විමර්ශන කෘතීන් ද පාඨක පරිහරණය සඳහා යොමු කොට තිබේ.

එමෙන් ම භාෂා මාධ්‍යය හතකින් (පාලි, සිංහල, ඉංග්‍රීසි, බුරුම, කාම්බෝජ්, දේවනාගිරි, තායි) මුද්‍රිත ථෙරවාද ත්‍රිපිටකය හා චීන ආගම පිළිබඳ තයිෂෝ මුද්‍රණය ද තිබේ.

පර්යේෂණ උපාධිධාරීන් විසින් ආයතනය වෙත ඉදිරිපත් කරන ලද දර්ශනපති හා ආචාර්ය උපාධි නිබන්ධන පුස්තකාලයේ තැන්පත් කොට ඇත.

<u>පුස්තකාල සේවා</u>

**පහත සඳහන් සේවා මූලික වශයෙන් පාඨකයන් වෙත සපයා ඇත.**
විමර්ශන සේවාව
පොත් බැහැරදීමේ සේවාව
ඡායාපිටපත් සේවාව
අන්තර්ජාල පහසුකම්
පරිගණක භාවිතය හා මුද්‍රණ පිටපත් ලබාදීමේ සේවාව
අන්තර් පුස්තකාල පිරුළු සේවාව
උපාධි නිබන්ධන **බැඳුම්** සේවාව

**<u>පුස්තකාලයේ ලියාපදිංචි පාඨක සංඛ්‍යාව</u>**

බාහිර පාඨකයින් සඳහා විමර්ශන පහසුකම් පමණක් සපයා ඇති අතර සෙසු පාඨකයින් සඳහා විමර්ශන සහ පොත් බැහැර දීමේ පහසුකම් සපයනු ලැබේ. ඒ අනුව පහත සහන් පරිදි පුස්තකාල සාමාජිකත්වය 2017 වර්ෂය සඳහා ලබා ගෙන ඇත.

| | |
|---|---|
| ආචාර්ය මණ්ඩලය | - 07 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - 22 |
| පශ්චාත් උපාධි අපේක්ෂකයින් | - 471 |
| බාහිර පාඨකයින් සහා සේවා සැපයීම | - 42 |
| එකතුව | - 542 |

**<u>කාර්ය මණ්ඩල සංයුතිය</u>**

ඉහත සඳහන් පාඨක සංඛ්‍යාව සඳහා සියලුම සේවාවන් සැපයීම පහත සඳහන් කාර්ය මණ්ඩලය විසින් සපයනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | - 01 |
| පුස්තකාල සහකාර | - 01 |
| පුස්තකාල සහායක | - 02 |
| එකතුව | - 04 |

**<u>2017 වර්ෂය තුළදී පොත් මිලදී ගැනීම හා පරිත්‍යාග ලෙස ලැබීම්</u>**

ආයතනයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් දේශීය සහ විදේශීය වශයෙන් පොත් මිලදී ගැනීම සහ පරිත්‍යාග ලෙස ලැබීම් පහත සහන් පරිදිය.

| | |
|---|---|
| මිල දී ගත් පොත් ගණන | - 622 |
| පරිත්‍යාග ලෙස ලැබුණු පොත් ගණන | - 945 |
| එකතුව | -1567 |

# 23. <u>පර්යේෂණ ඒකකය</u>

**ආචාර්ය පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි - විද්‍යාත්මක සහකාර**
**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ මහතා - විද්‍යාත්මක සහකාර**

දර්ශනපති සහ ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධ පිළිබඳ පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන අපේක්ෂකයින් විසින් නිවැරදිව සිදු කරන ලද දැයි පරීක්ෂා කර බලා වාර්තා කිරීම සහ පර්යේෂණ අධ්‍යයනයන්හි නිරතව සිටින ශිෂ්‍යයින් වෙනුවෙන් විශේෂ සම්මන්ත්‍රණ මාලා සංවිධානය කිරීම මෙන් ම පොදුවේ පර්යේෂණ ශිෂ්‍යයින්ට ස්වකීය පර්යේෂණ කටයුතු කර ගෙන යාම සඳහා මඟ පෙන්වීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

# 24. අධ්‍යයන චාරිකාව

2017 වර්ෂයේ අගෝස්තු මස 08 සහ 09 දෙදින විදේශීය ශිෂ්‍යයන් සඳහා වූ අධ්‍යයන චාරිකාව අනුරාධපුරය, මිහින්තලය ඓතිහාසික නගර ආශ්‍රිතව සිදු කරන ලදී. ඒ සඳහා 155ක් පමණ පිරිසක් සහභාගී වූ අතර පන්ති කාමරයේ න්‍යායික දැනුම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන ස්වරූපයකින් ක්‍රියාත්මක විය. අධ්‍යයන කාර්ය මණ්ඩලය බාහිර විද්වතුන්ගේ ද සහභාගිත්වය ඇතිව සම්පත් දායකත්වය ලබාදුන් අතර ශිෂ්‍ය ප්‍රජාවේ අපේක්ෂා ඵල ගන්වන අන්දමින් අධ්‍යයන චාරිකාව සාර්ථකව දින දෙකක් පුරාවට පැවැත්විණ.



# 25. සම්මන්ත්‍රණ

භික්ෂු විනය, කතිකාවත් හා නූතන අභියෝග මැයෙන් වූ කාලීන මාතෘකාව යටතේ ජාතික සම්මන්ත්‍රණයේ දෙවන පියවර 2017.03.14 දින ආයතනයේදී පවත්වන ලදී.

ක්ෂේත්‍රයේ ප්‍රමාණික විද්වතුන් රාශියකගේ සහභාගිත්වයෙන් දවස පුරා පවත්වන ලද වැඩසටහන සැසිවාර හතරකින් සමන්විත විය. වැඩසටහන අවසානයේදී මීළඟ වැඩ සටහන සඳහා පදනම් වූ කරුණු පිළිබඳව අවධානය යොමු වූ අතර මෙම වර්ෂය තුළදී ඊළඟ වැඩසටහන ද සංවිධානය කිරීමට තීරණය විය.

ඒ අනුව කතිකාවත තුන්වන සම්මන්ත්‍රණය 2017.10.16 දින පවත්වන ලදී. අවසාන සම්මන්ත්‍රණය 2018 වර්ෂයේදී පවත්වා 2019 වසර තුළ යෝජනාවලිය අදාළ පාර්ශ්ව වෙත යොමු කිරීමට තීරණය විය.



# 26. පුනරාවර්තන වියදම්

| විෂයය | 2016 රු.ශත | 2017 රු.ශත | වෙනස |
|---|---|---|---|
| (අ) වැටුප් හා වේතන | 40,629,392 | 48,910,105 | 8,280,713 |
| (ආ) ගමන් වියදම් | 1,184,729 | 1,352,953 | 168,224 |
| (ඇ) සැපයුම් | 1,280,809 | 2,207,817 | 927,008 |
| (ඈ) නඩත්තු | 1,138,048 | 1,168,338 | 30,290 |
| (ඉ) බැඳුම්ගත සේවා | 15,123,678 | 16,830,032 | 1,706,354 |
| (ඊ) වෙනත් | 27,903,405 | 29,134,694 | 1,231,289 |
| එකතුව | 87,260,061 | 99,603,939 | 12,343,878 |

# 27. ප්‍රාග්ධන වියදම්

| විෂයය | 2016 (රු.ශත) | 2017 (රු.ශත) | වෙනස |
|---|---|---|---|
| (අ) භූමිභාගය | - | 148,634,464 | 148,634,464 |
| (ආ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම. | 1,167,683 | 5,124,431 | 3,956,748 |
| (ඉ) යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම. | - | - | - |
| (ඊ) ගොඩනැගිලි | - | - | - |
| (උ) වෙනත් | 1,118,489 | 2,950,432 | 1,831,942 |
| එකතුව | 2,286,172 | 156,709,327 | 154,423,155 |

# 28. මූලාමය ප්‍රගතිය (වියදම්)

| විෂයය | අයවැයගත වෙන් කිරීම් | | වියදම | | අතිරික්ත/ඌනතාව (රු.ශත) | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| (අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 57,200,000 | 67,742,000 | 70,327,036 | 81,376,235 | (13,127,036) | (13,634,235) |
| (ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 10,000,000 | 158,634,000 | 2,286,172 | 156,709,327 | 7,713,828 | 1,924,673 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ආයෝජන | 12,800,000 | 12,850,000 | 16,933,025 | 18,228,087 | (4,133,025) | (5,378,087) |
| (ඈ) ව්‍යාපෘති - විදේශීය ආයෝජන | - | - | - | - | - | - |
| එකතුව | 80,000,000 | 239,226,000 | 89,546,233 | 256,313,649 | (9,546,233) | (17,087,649) |

# 29. මූලාමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම)

| ආදායම් මාර්ග | ඇස්තමේන්තුගත මුදල (රු. ශත) | | එකතුව (රු.ශත) සත්‍ය ආදායම | | අතිරික්තය/ ඌනතාවය | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| (අ) උපාධි අපේක්ෂක | - | - | - | - | - | - |
| (ආ) පශ්චාත් උපාධි | 57,200,000 | 34,150,000 | 36,830,886 | 44,572,877 | 20,369,114 | (10,422,877) |
| (ඇ) උපදේශන සේවා | - | - | - | - | - | - |
| (ඈ) වෙනත් | 12,800,000 | 12,850,000 | 19,156,064 | 23,856,473 | (6,356,064) | (11,006,473) |
| එකතුව | 70,000,000 | 47,000,000 | 55,986,950 | 68,429,350 | 14,013,050 | (21,429,350) |

# 30. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2017

| විෂයය | ගණනය කිරීමේ ක්‍රමවේදය | එක් සිසුවකු සඳහා වියදම | |
|---|---|---|---|
| | | 2016 | 2017 |
| (අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම /ශිෂ්‍ය සංඛ්‍යාව | 110,456 | 144,354 |
| (ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | 2,894 | 227,115 ** |
| එකතුව | | 113,350 | 371,469 |

** **2017** වර්ෂයේ ආයතනය සඳහා ඉඩමක් මිලදී ගැනීම නිසා ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම 2016 වර්ෂය හා සංසන්දනය කිරීමේදී කැපී පෙනෙන වර්ධනයක් දක්නට ඇත.

# 31. 2013 – 2017දක්වා ආයතනයේ මූල්‍ය තත්වය

| වර්ෂය | පුනරාවර්තන සඳහා රජයේ ආධාර<br>A | 102 - මූලධන සඳහා රජයේ ආධාර<br>B | ආයතනික ඉපයීම්<br>C | මුළු පුනරාවර්තන ආදායම<br>D<br>(A+C) | මුළු පුනරාවර්තන වියදම<br>E | පුනරාවර්තන මූල්‍යකටයුතු වල ප්‍රතිඵලය<br>F<br>(D-E) |
|---|---|---|---|---|---|---|
| **2013** | **11,417,000** | **2,550,000** | **26,474,565** | **37,891,565** | **41,359,197** | **(3,467,632)** |
| **2014** | **24,150,000** | **2,000,000** | **30,109,778** | **54,259,778** | **55,041,448** | **(781,671)** |
| **2015** | **12,000,000** | **2,750,000** | **45,303,098** | **57,303,098** | **64,274,134** | **(6,971,036)** |
| **2016** | **23,400,000** | **6,400,000** | **61,874,729** | **85,274,729** | **87,260,061** | **(1,985,332)** |
| **2017** | **33,592,000** | **152,934,464** | **68,429,350** | **102,021,350** | **99,603,937** | **2,417,412** |


<u>පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයේ ආදායම් ලැබීම හා අදාළ මූල්‍ය තත්ව වාර්තාව.</u>

<u>පසුගිය වසර කිහිපය තුළ ආයතනයේ විදේශ විනිමය ආදායම</u>

**ඒ පිළිබඳ දත්ත පහත පරිදි වේ.**

| වර්ෂය | විදේශ විනිමය ආදායම(ඇ.ඩො.) |
|---|---|
| 2012 | 137,555 |
| 2013 | 117,730 |
| 2014 | 132,300 |
| 2015 | 193,748 |
| 2016 | 216,235 |
| 2017 | 258,405 |


<u>පසුගිය වසර කිහිපය තුළ ආයතනයේ විදේශ විනිමය ආදායම</u>
(ප්‍රස්තාරික නිරූපණය)



**<u>පසුගිය වසර කිහිපය තුළ ආයතනයේ ඉපැයීම්</u>**

| වර්ෂය | ආදායම(රු.) |
|---|---|
| 2013 | 23,806,012 |
| 2014 | 27,638,270 |
| 2015 | 39,923,995 |
| 2016 | 55,986,950 |
| 2017 | 62,800,964 |

**<u>පසුගිය වසර කිහිපය තුළ ආයතනයේ ඉපැයීම් (ප්‍රස්තාරික නිරූපණය)</u>**




**පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය වෙත රජයෙන් ලද ආධාර**

මෙම ආයතනයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වාර්ෂිකව ලද ආධාර පහත පරිදි වේ.

| වර්ෂය | පුනරාවර්තන ආධාර (රු.) |
|---|---|
| 2013 | 11,417,000 |
| 2014 | 24,150,000 |
| 2015 | 12,000,000 |
| 2016 | 23,400,000 |
| 2017 | 33,592,000 |


**පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය වෙත රජයෙන් ලද ආධාර (ප්‍රස්තාරික නිරූපණය)**



| වර්ෂය | අතිරික්තය /ඌනතාවය (රු.) |
|---|---|
| 2013 | (3,467,632) |
| 2014 | (781,671) |
| 2015 | (6,971,036) |
| 2016 | (1,985,332) |
| 2017 | 2,417,412 |

<u>**ආයතනයේ මූල්‍යමය ප්‍රගතිය**</u>

පසුගිය වර්ෂ **කිහිපය තුළ** ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අතිරික්තය/ඌනතාවය



## 32. වාර්තාව සඳහා අදාළ වෙනත් තොරතුරු

**01.** අවසාන ගිණුම් - 2017

**02.** කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
# (කැලණිය විශ්වවිද්‍යාලය)

## අවසාන ගිණුම් - 2017

**113,**
**දුටුගැමුණු මාවත,**
**කොහුවල.**

## <u>2017 වර්ෂය සඳහා වන මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව</u>

## <u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය – කැලණිය විශ්වවිද්‍යාලය</u>

**වාර්තා කිරීමේ ආයතනය**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබ ඇත.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා තිස් අටක් (38) සම්පාදනය කරනු ලැබ ඇත.

2017 වර්ෂය සඳහා ලබා ගෙන ඇති ප්‍රතිපාදන වෙන්කිරීම් පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| පුනරාවර්තන වෙන්කිරීම් | **රු.33,592,000.00** |
| 102 ප්‍රාග්ධන වෙන්කිරීම් | **රු.152,934,464.00** |

රජයේ ප්‍රදාන ඇතුලත්ව, මෙම වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු.102,021,350/- ක් වූ අතර, පුනරාවර්තන වියදම රු.99,603,937/- ක් විය. ඒ අනුව, පුනරාවර්තන මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය ලෙස රු.2,417,412/- ක අතිරික්තයක් ඇති විය.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂ

**<u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය</u>**

**<u>කැලණිය විශ්වවිද්‍යාලය</u>**

**<u>2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව</u>**

| වත්කම් | සටහන් | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම් (උපලේඛනය H)** | | රු. | රු. | රු. | රු. |
| දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න | 01 | 163,199,504 | | 10,691,163 | |
| ආයෝජන | 02 | 18,864,650 | | 12,241,876 | |
| වෙනත් මූල්‍ය වත්කම් | 03 | 1,163,549 | | 1,031,858 | |
| | | | **183,227,702** | | **23,964,897** |
| **ජංගම වත්කම්** | | | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම | 04 | 509,553 | | 534,370 | |
| ගබඩා ගිණුම (පොත් මුද්‍රණය) | 05 | 1,397,829 | | 1,611,049 | |
| සුළු ණයගැතියන් | 06 | 51,860 | | 589,946 | |
| කාර්ය මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම් | 07 | 3,113,277 | | 3,125,867 | |
| විවිධ අත්තිකාරම් | 08 | 1,000 | | 3,509 | |
| පෙර ගෙවුම් | 09 | 732,192 | | 55,471 | |
| මුදල් සහ මුදල් සමානයන් | 10 | 36,780,693 | | 27,351,484 | |
| වෙනත් | 11 | 65,000 | **42,651,402** | 65,000 | **33,336,696** |
| **මුළු වත්කම්** | | | **225,879,105** | | **57,301,593** |
| | | | | | |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| තැන්පතු | 12 | 1,789,089 | | 896,689 | |
| සුළු ණයහිමියන් | 13 | 6,699 | | 3,934 | |
| උපචිත වියදම් | 14 | 4,302,081 | | 6,567,548 | |
| වෙනත් | 15 | 11,460,052 | | 3,748,194 | |
| **ජංගම නොවන වගකීම්** | | | **17,552,921** | | **11,216,365** |
| ප්‍රාග්ධන ප්‍රදාන වැයවීම් | 16 | 168,742,953 | | 15,598,252 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 17 | 2,703,670 | | 6,598,635 | |
| **සීමා කළ අරමුදල්** | | | **171,446,623** | | **22,196,887** |
| විශේෂ අරමුදල් | 18 | 8,058,453 | | 7,368,961 | |
| පර්යේෂණ ප්‍රදාන | 19 | 1,170,353 | | 1,120,032 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 20 | 7,823,826 | | 8,460,187 | |
| වෙනත් | 21 | 19,803,458 | | 11,302,526 | |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 22 | 9,456,536 | | 10,085,124 | |
| | | | **46,312,626** | | **38,336,831** |
| **මුළු වගකීම්** | | | **235,317,169** | | **71,750,082** |
| **දළ වත්කම්** | | | (9,438,064)<br>======== | | (14,448,489)<br>========= |
| | | | | | |
| **දළ වත්කම්/සම කොටස්** | | | | | |
| **ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| පිළිඇගයීම් ශේෂ ගිණුම | | 1,846,372 | | | |
| ආයතනවල සාමාන්‍ය ශේෂ ගිණුම | 23 | (11,284,436) | (9,438,064) | (16,294,861) | (14,448,490) |
| | | | | | |
| මුළු දළ වත්කම්/සම කොටස් | | | (9,438,064)<br>======== | | (14,448,490)<br>========= |

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි
සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි
කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර,
එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්
මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, 1978 අංක 16 දරන
විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත
විධිවිධාන හා අනුකූල වේ.

| | | |
|---|---|---|
| මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි මහත්මිය | කළමනාකරණ මණ්ඩල සාමාජික | ඒ.පී.එස්.එම්. දොලගේ |
| අධ්‍යක්ෂ | පාලි හා බෞද්ධ අධ්‍යයන | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි |
| පාලි හා බෞද්ධ අධ්‍යයන | පශ්චාත් උපාධි ආයතනය | පාලි හා බෞද්ධ අධ්‍යයන |
| පශ්චාත් උපාධි ආයතනය | | පශ්චාත් උපාධි ආයතනය |

**<u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය</u>**

**<u>කැලණිය විශ්වවිද්‍යාලය</u>**

**2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන වාර්තාව**

| | සටහන් | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| **ආදායම්** | | රු. | රු. | රු. | රු. |
| රජයේ ආදායම් - පුනරාවර්තන | 25 | 33,592,000 | | 23,400,000 | |
| | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | |
| ණය පොලී | | 130,881 | | 138,381 | |
| විවිධ ලැබීම් | 24 | 3,129,836 | | 2,063,788 | |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 880,500 | | 798,000 | |
| පංති ගාස්තු | | 39,481,072 | | 35,193,386 | |
| විභාග ගාස්තු | | 348,000 | | 306,500 | |
| පුස්තකාල ගාස්තු | | 587,000 | | 533,000 | |
| ප්‍රකාශන අලෙවිය | | 12,950 | | 14,872 | |
| පුස්තකාල දඩ ගාස්තු | | 2,639 | | 5,999 | |
| දීර්ඝ කළ ව්‍යාපෘති ආදායම් | | 18,228,087 | | 16,933,025 | |
| ක්‍රමක්ෂය | 25 | 5,355,215 | | 5,580,693 | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 25 | 273,171 | | 307,086 | |
| **මුළු ආදායම** | | | **102,021,350** | | **85,274,729** |
| | | | | | |
| **වියදම්** | | | | | |
| පෞද්ගලික වේතන - අධ්‍යයන | 25 | 24,582,181 | | 16,452,206 | |
| පෞද්ගලික වේතන - අනධ්‍යයන | 25 | 24,327,924 | | 24,177,186 | |
| ගමනාගමන | | 1,352,953 | | 1,184,729 | |
| සැපයුම් | | 2,207,817 | | 1,280,809 | |
| නඩත්තු | | 1,168,338 | | 1,138,048 | |
| කොන්ත්‍රාත් සේවා | | 16,830,032 | | 15,123,678 | |
| ක්ෂයවීම් සහ වෙනත් මෙහෙයුම් වියදම් | 25 | 4,319,898 | | 4,996,061 | |
| වෙනත් වියදම් | 25 | 24,814,796 | | 22,907,344 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු වියදම් | | | **99,603,937** | | **87,260,061** |
| | | | | | |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(හිඟය) | | | **2,417,412** | | **(1,985,332)** |
| | | | | | |
| <u>මූල්‍ය පිරිවැය</u> | | | | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර සහ ආම්පන්න විකුණුම් මත ලැබීම් | | | - | | - |
| මෙහෙයුම් නොවන මුළු ආදායම (වියදම්) | | | <u>2,417,412</u> | | <u>(1,985,332)</u> |
| අතිවිශේෂ කටයුතුවල අතිරික්තය/(හිඟය) | | | | | |
| අතිවිශේෂ කටයුතු | | | - | | - |
| කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය) | | | | | - |
| | | | 2,417,412<br>======== | | (1,985,332)<br>========= |

මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමෙහි
සහ ඉදිරිපත් කිරීමෙහි ලා මෙම ආයතනයෙහි
කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබන අතර,
එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්
මෙම මූල්‍ය වාර්තාවලට අත්සන් තබා ඇත.

මෙම මූල්‍ය වාර්තා, 1978 අංක 16 දරන
විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත
විධිවිධාන හා අනුකූල වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
මහත්මිය
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

කළමනාකරණ මණ්ඩල සාමාජික
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම්. දොලගේ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය

<u>**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**</u>

<u>**කැලණිය විශ්වවිද්‍යාලය**</u>

<u>**2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ වාර්තාව**</u>

| | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | | 2,417,412 | | (6,971,036) |
| | | | | |
| **මුදල් ප්‍රවාහ ඇතුලත් නොවන කටයුතු සඳහා ගැලපීම්** | | | | - |
| පාරිතෝෂිත | | 1,983,474 | | 1,146,237 |
| ක්ෂයවීම් | | 4,149,599 | | 4,244,470 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 170,299 | | 86,408 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | (273,171) | | (1,134,633) |
| ක්‍රමක්ෂය | | (5,355,215) | | (4,244,471) |
| | | 3,092,398 | | (6,873,025) |
| පූර්ව කාලසීමා කටයුතු | | - | | - |
| කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම්වලට ප්‍රථම මෙහෙයුම් අතිරික්තය | | **3,092,398** | | **(6,873,025)** |
| | | | | |
| **කාරක ප්‍රාග්ධන කටයුතුවල වෙනස්වීම්** | | | | |
| ගබඩා අත්තිකාරම්හි හා පර්යේෂණ සහ ප්‍රකාශන තොගවල පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | 238,038 | | 23,371 | |
| සුළු ණයගැතියන්ගේ පහළ යාම/(ඉහළ යාම) | 538,086 | | (109,326) | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | 12,590 | | 92,760 | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම්හි පහළ යාම/(ඉහළ යාම) | 2,509 | | 45,875 | |
| අත්තිකාරම් ගෙවීමෙහි පහළ යාම/(ඉහළ යාම) පහළ යාම | (676,721) | | 726,691 | |
| වෙනත් තැන්පතුවල පහළ යාම/(ඉහළ යාම) | - | | - | |
| ලැබිය හැකි ආයෝජන මත පොලියෙහි පහළ යාම/(ඉහළ යාම) | - | | - | |
| තැන්පතු සහ සුළු ණයහිමියන්ගේ ඉහළ යාම | 895,165 | | 361,904 | |

| | | | | |
|---|---|---|---|---|
| (පහළයාම) | | | | |
| උපචිත වියදම් සහ අනෙකුත් වගකීම්හි ඉහළ යාම (පහළයාම) | 5,446,391 | **6,456,058** | 336,994 | 1,478,269 |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ දළ මුදල් ප්‍රමාණය** | | **9,548,456** | | **(5,394,756)** |
| | | | | |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (156,364,437) | | (3,370,723) | |
| වෙනත් ආයෝජන | (6,754,465) | | (3,787,302) | |
| ආයෝජන කටයුතු සඳහා භාවිත කළ දළ මුදල් | | **(163,118,901)** | | **(7,158,025)** |
| | | | | |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 152,934,464 | | 2,750,000 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 795,676 | | 1,112,293 | |
| වෙනත් අරමුදල් | 9,269,514 | | 3,869,790 | |
| මූල්‍ය කටයුතුවලින් ජනනය වූ මුදල් | | 162,999,654 | | 7,732,082 |
| **මුදල් සහ මුදල් සමානයන්හි දළ ඉහළයාම** | | **9,429,209** | | **(4,820,698)** |
| වසර මුලදී මුදල් සහ මුදල් සමානයන්හි ශේෂය | | 27,351,484 | | 8,012,202 |
| වසර අගදී මුදල් සහ මුදල් සමානයන්හි ශේෂය (සටහන 1) | | **36,780,693** ======== | | **3,191,503** ======= |
| | | | | |
| **සටහන 1** | | **2017** | | **2016** |
| | | රු. | | රු. |
| බැංකු ශේෂය | | 36,780,693 | | 27,351,484 |
| අනෙක් බැංකු ශේෂය | | - | | - |
| | | **36,780,693** ======== | | **27,351,484** ======= |

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/සම කොටස්හි වෙනස්කම්**

<u>පිළිබඳ වාර්තාව</u>

| | ආයතනයෙහි සාමාන්‍ය සංචිතය රු. | පිළිඇගයීම් ශේෂ ගිණුම රු. | මුළු වටිනාකම රු. |
|---|---|---|---|
| **2015-01-01 දිනට ශේෂය** | (7,411,260) | 798,276 | (6,612,984) |
| බැහැර කළ පරිත්‍යාග අයිතමයන්හි මාරු කළ අගය | - | - | - |
| 2015 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | <u>(6,971,036)</u> | 1,048,095 | <u>(5,922,941)</u> |
| **2015-12-31 දිනට ශේෂය** | **(14,382,297)** ========= | **1,846,372** ======= | **(12,535,925)** ======== |
| | | | |
| **2016-01-01 දිනට ශේෂය** | (14,382,297) | 1,846,372 | (12,535,294) |
| කිම් ප්‍රදානයේ ශේෂය සංචිතය වෙත මාරු කිරීම | 4,529 | - | 4,529 |
| බෞද්ධ ආයුර්වේද ශේෂය සංචිතය වෙත මාරු කිරීම | 50,000 | - | 50,000 |
| ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා ගැලපුම් | <u>18,238</u> | - | <u>18,238</u> |
| 2016 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | (1,985,332) | - | (1,985,332) |
| **2016-12-31 දිනට ශේෂය** | (16,294,862) | 1,846,372 | **(14,448,490)** |
| | | | |
| **2017-01-01 දිනට ශේෂය** | (16,294,862) | 1,846,372 | **(14,448,490)** |
| පිළිගැනීමේ මේස සඳහා වන ක්ෂය කිරීම් ඉහළ දැමීම සංචිතයට මාරු කිරීම | 37,888 | - | 37,888 |
| කාර්යාල උපකරණ ගිණුම තුල බඩිරි තරාදිය සඳහා ගැලපුම් | 13,500 | - | 13,500 |
| 2014 චෙක්පත් නිශ්කාෂණ වෙනස | 35 | - | 35 |
| බඩිරි තරාදිය සඳහා ක්ෂය කිරීම් ඉහළ දැමීම සංචිතයට මාරු කිරීම | 13,500 | - | 13,500 |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පහළ දැමීම සංචිතයට මාරු කිරීම | 2,612,062 | - | 2,612,062 |
| පිළිගැනීමේ මේස සඳහා ක්ෂය කිරීම් ක්‍රමක්ෂය | (37,888) | - | (37,888) |

| | | | |
|---|---|---|---|
| බඩ්රි තරාදිය සඳහා ක්ෂය කිරීම් ක්‍රමක්ෂය | (13,500) | - | (13,500) |
| අවලංගු කරන ලද වැටුප් චෙක්පත සඳහා ගැලපුම් | (32,211) | - | (32,211) |
| ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා ගැලපුම් | (423) | - | (423) |
| 2017 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | 2,417,412 | | 2,417,412 |
| **2017-12-31 දිනට ශේෂය** | **(11,284,486)** | **1,846,372** | **(9,438,114)** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1. සාමාන්‍ය ප්‍රතිපත්ති

### 1.1. ප්‍රධාන කටයුතු සහ සකස් කිරීමේ ස්වභාවය

මෙම ආයතනය විසින් පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා විශේෂඥතාවක් දක්වනු ලබන සිසුන් වෙත පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව සහ පර්යේෂණය ලබා දෙන අතර, උපාධි සහ ඩිප්ලෝමා පිරිනමනු ලබයි.

### 1.2. සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය වාර්තා, මූල්‍ය තත්ත්ව වාර්තා, මූල්‍ය කාර්යසාධන වාර්තාව, දළ වත්කම් සහ සමකොටස්හි වෙනස්කම් වාර්තාව, මූල්‍ය ප්‍රවාහ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන් විසින් නිකුත් කරන ලදුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිය මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 03/2011 මඟින් අදාල කර ගනු ලැබ ඇති, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව, ආයතනයෙහි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත.

### 2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න

ලී බඩු සහ මෙවලම්, කාර්යාලයීය උපකරණ, ඉගැන්වීමේ උපකරණ, පුස්තකාල පොත් සහ කාලීන සඟරා, මෝටර් රථ සහ රජයේ ප්‍රදාන මඟින් ලබාගෙන ඇති වෙනත් වත්කම් සහ භාණ්ඩ, අභ්‍යන්තරිකව ජනනය වූ මුදල් සහ පරිත්‍යාග.

#### (අ) හඳුනාගැනීමේ පදනම

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හඳුනාගත හැකි වනුයේ, මෙම අයිතම

හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා යනු ලැබුවහොත් සහ එම අයිතමවල පිරිවැය හැකිතාක් දුරට ගණනය කරනු ලැබිය හැකි සම්භාවිතාවක් ඇත්නම් පමණි.

අවුරුදු 5 සිට 10 දක්වා පරාසයක් තුල දිවෙන ආර්ථික කාලසීමාවක් සහිත එක් එක් ප්‍රභේද 5ක් තුල, එම අදාළ ප්‍රභේදය මත වත්කමක ආයු කාලය රඳා පවතී.

**(ආ) ක්ෂයවීම්**

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න භාවිතය සඳහා යොදා ගනු ලබන දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුවසෘජු රේඛීය ක්‍රමවේදය මත, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ.

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත සඳහන් පරිදි වේ :

| වත්කම | ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය |
|---|---|
| ලී බඩු සහ මෙවලම් | අවුරුදු 10 |
| විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ | අවුරුදු 05 |
| කාර්යාලයීය උපකරණ | අවුරුදු 05 |
| පුස්තකාල පොත් සහ කාලීන සඟරා | අවුරුදු 05 |
| මෝටර් රථ | අවුරුදු 05 |

**(ඇ) කාර්යාල පරිශ්‍ර සහ එහි නඩත්තු කිරීම්**

දැනට මෙම ආයතනය කුලියට ගන්නා ලද ගොඩනැගිල්ලක පිහිටුවා ඇති අතර, රු.25,000/- නොඉක්මවන සුළු අලුත්වැඩියාකිරීම් සඳහා ගෙවීම් සිදු කිරීමට ආයතනය විසින් එකඟතාව පල කරනු ලැබ ඇත. ඇති වන පරිදි, නඩත්තු පිරිවැය ආදායම් හා වියදම් ගිණුමට ඇතුලත් කෙරෙනු ලැබේ.

**(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණ කරනු ලැබ ඇත. අවසන් ගිණුම් සමඟ ස්ථාවර වත්කම් සැසඳීම 2015-12-31 දිනට අවසන් කරන ලද අතර, විශේෂ කමිටුව විසින් මෙම කාර්යය නිරීක්ෂණය කර, වාර්තාවක් නිකුත් කරන ලදී. 2017-02-27 දින පැවැති 47වන විගණන කමිටුව වෙත කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලද අතර, විගණන කමිටු උපදෙස් මත අවශ්‍ය පියවර ගනු ලැබේ.

**3. ජංගම වත්කම්**

ශේෂ පත්‍රයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත්තේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුල නැවත අය කර ගනු ලැබිය හැකි වත්කම්ය.

**3.1. භාණ්ඩ ලේඛන සහ තොග**

**(අ)** භාණ්ඩ ලේඛනයන්හි පිරිවැය, first-in-first-out පදනම මත නිර්ණය කරනු ලැබ ඇති අතර, ඒවා අත්පත් කරගැනීමේදී සහ පෙර පැවැති තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒම පිණිස දැරීමට සිදු වන පිරිවැය ඇතුලත් වේ.

**(ආ)** දිගු කාලයක් පුරා (2005ට පෙර) ගබඩා අත්තිකාරම් ගිණුමේ සහ තොග ශේෂයන් අතර වෙනසක් පැවැති අතර, 2016 වර්ෂයේදී, එය සසඳා, විගණන හා කළමනාකරණ කමිටු අනුමැතිය සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව, වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් යවා ඇත.

**4. ජංගම වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වගකීම් වනුයේ, මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට එක් වසරක් තුල ගෙවනු ලැබිය යුතු වගකීම්ය. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, දත් සියලුම වගකීම් ගණනය කරනු ලැබ ඇත.

**5. පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්**

සියලුම සේවකයින් එම වසර තුලදීම විශ්‍රාම ගනු ලබන්නේ නම් ගෙවනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය පිළිබඳව පූර්ව නිගමනය කරමින්, 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත යටතේ විශ්‍රාම ගනු ලබන පුද්ගලයින් වෙත ගෙවනු ලැබිය හැකි පාරිතෝෂිත සඳහා මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත.

**6. පොලී ආදායම**

කාලසීමාව සඳහා ලද සහ ලැබීමට නියමිත පොලී ආදායම, බාහිරව සීමා කරනු ලැබූ පරිත්‍යාග මත උපයන ලද ආයෝජන ආදායම් හැර, ලද ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කෙරෙනු ලැබේ. එවැනි අරමුදල් මත හිඟ පොලී ආදායම්, එම වර්ෂය තුල ඍජු අරමුදල් ඉහළ යාමක් ලෙස වාර්තා කෙරෙනු ලැබේ.

**7. වියදම් හඳුනාගැනීම**

අධ්‍යාපන සහ පර්යේෂණ හා සම්බන්ධ සියලුම වියදම්, උපචිත වියදම් ලෙස වාර්තා කෙරෙනු ලබන අතර, ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීමේදී හෝ වැඩිදියුණුකිරීමේදී පැන නැඟිනු ලබන සියලුම වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

**8. විදේශ විනිමය**

තැන්පතු සිදු කරනු ලබන දිනයේදී පවතින විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය තුල සිදු කෙරෙනු ලබන ගණුදෙණු වාර්තාගත කෙරෙනු ලැබේ.

**9. අදාළ අනුමැතීන් ද සහිතව, අතිරේක වැය ශීර්ෂවල සිට හිඟ වැය ශීර්ෂ වෙත වියදම් මාරු කිරීමේදී, අවස්ථා කිහිපයකදී පහත සඳහන් අයවැය මාරු කිරීම් සිදු කරනු ලැබ ඇත:**

I. ඉන්ධන හා ලිහිසි තෙල්වලින් (3.02) ගමන් වියදම් (දේශීය) වෙත රු.150,000/-ක් මාරු කිරීම - 2.01;

II. ඉන්ධන හා ලිහිසි තෙල්වලින් (3.02) ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා (3.01) වෙත රු.220,000/-ක් මාරු කිරීම;

III. ඉන්ධන හා ලිහිසි තෙල්වලින් (3.02) අනුපාත හා දේශීය බදු (5.09) වෙත රු.30,000/-ක් මාරු කිරීම;

IV. ආරක්ෂක සේවාවලින් (5.05) විදුලි සංදේශ (5.02) වෙත රු.300,000/-ක් මාරු කිරීම;

V. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙත ලබා දෙන සංචාරක ප්‍රදාන (06.01) වලින් විශේෂ සේවා, වෘත්තීය හා වෙනත් ගාස්තු (6.03) වෙත රු.400,000/-ක් මාරු කිරීම;

VI. අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන (6.05)වලින් විනෝදාත්මක වියදම් (6.09) වෙත රු.50,000/-ක් මාරු කිරීම;

VII. සුළු අලුත්වැඩියාකිරීම් හා නඩත්තු කටයුතුවලින්, වාහනවලින් (4.01) රු.100,000/-ක් සහ සුළු අලුත්වැඩියාකිරීම්, නඩත්තු හා වෙනත් කටයුතුවලින් (4.05) රු.135,000/-ක් යන්ත්‍රෝපකරණ, ආම්පන්න හා උපකරණ සුළු අලුත්වැඩියාකිරීම් හා නඩත්තු වෙත (4.02) මාරු කිරීම;

VIII. තැපැල් ගාස්තුවලින් (5.03) විදුලිය (5.04) වෙත රු.200,000/-ක් මාරු කිරීම;

IX. ජලයෙන් (5.06) බදු කුලී හා කුලී (5.08) වෙත රු.450,000/-ක් මාරු කිරීම;

X. පර්යේෂණ ශක්තිමත් කිරීම්වලින් (102) ශිෂ්‍ය සුබසාධනය, සේවක සුබසාධනය, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියාව (6.17) වෙත රු.1,205,615.67/-ක් මාරු කිරීම.

## 10. පෞද්ගලික වේතන

පෞද්ගලික වේතනවලට අදාළව, වැදගත් ගණයෙහිලා ගැනෙන පූරප්පාඩු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු හඳුනා ගැනෙන ලදී :

1. 2017 වර්ෂයේ මුල සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිව් (04) දෙනෙකු මහාචාර්යවරුන් බවට පත්වන ලදී.

2. අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් පස් (05) දෙනෙකු 2017 වර්ෂයේදී කාර්යමණ්ඩලයට බැඳෙන ලදී.

3. 2017 අයවැය සකස් කිරීමේදී, ඇස්තමේන්තුගත ආදායම සඳහා දැනට එකඟ වී ඇති අයවැය ඉදිරිපත් කිරීම අවශ්‍ය වූ හෙයින්, දැනට සිටින කාර්යමණ්ඩලය පමණක් (පූරප්පාඩු නොසලකා හැර ඇත) ඊට ඇතුලත් කරනු ලැබ ඇත.

4. 2017 වර්ෂයේ සිට අනධ්‍යයන කාර්යමණ්ඩලය වෙත 15%ක වැටුප් වර්ධකයක් ලබා දීම.

කෙසේවුවද, ආයතනය මඟින් උත්පාදනය වූ ආදායමෙන් 31%ක මුළු පෞද්ගලික වේතන පිරිවැය ආවරණය කරනු ලැබ ඇත.

## 11. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සෘජු නොවන ක්‍රමවේදය භාවිත කරමින් සකස් කරනු ලැබ ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/පීඅයිපීජී/1/17 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 අගෝස්තු දින

අධ්‍යක්ෂ

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූ.ලිඛ. ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :- 1. උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය

2. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

3. ලේකම්, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

4. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oagg ov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/පීඅයිපීබී/1/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 අගෝස්තු දින

අධ්‍යක්ෂ

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94 11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.83,654 ක පොළී ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) බැංකු ශේෂ සනාථ කිරීම අනුව ස්ථාවර තැන්පතු 06 ක වටිනාකම රු.19,147,006 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ආයෝජන වටිනාකම රු.18,915,063 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු.231,943 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 1997 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රදාන ලෙස ආයතනයට ලැබී තිබුණු පිරිවැය රු.1,116,040 ක් වූ වත්කම සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද ඊට අදාළ අරමුදල ක්‍රමානුකූල පදනමක් මත ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පිරිවැය හඳුනා නොගත් වත්කම 159 ක වටිනාකම රු.581,800 ක් ලෙස 2016 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණද, එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර තිබූ වත්කම් වලට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කිරීමකින් තොරව විකුණුම් මිල රු.15,400 ක් අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි.

### 2.2.2 අවිනිශ්චිත ගිණුම

2011 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.5,120 ක් වුවද මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ස්ථාවර වත්කම් ලේඛනය අනුව වත්කම් පන්තීන් 03 ක වටිනාකම රු.43,953,197 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.47,774,866 ක් වූයෙන් රු.3,821,669 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1979 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 11 (5) වගන්තිය | නිවාඩු ලබානොගෙන අනුගාමී රැස්වීම 03 කට නොපැමිණියහොත් ධූරය අතහැර ගියා සේ සැලකිය යුතු වුවත් පීඨ සභාවට පත්වී තිබුණු කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි අධ්‍යයන අංශ ප්‍රධානියා සමාලෝචිත වර්ෂයේ කිසිම රැස්වීමක් සඳහා සහභාගී වී නොතිබුණු අතර සංස්කෘත අධ්‍යයන අංශය නියෝජනය කරමින් සහභාගීවී තිබූ පීඨ සභා සාමාජිකයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් සහභාගීවී තිබූ පීඨ සභා සාමාජිකයා අඛණ්ඩව රැස්වීම් වාර 04 කට සහභාගී වී නොතිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් අතිරික්තය රු.2,417,412 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,985,332 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,402,744 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ වියදම් රු.12,343,876 කින් වැඩිවී තිබුණද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.10,192,000 කින් හා වෙනත් ආදායම් රු.6,554,621 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී තිබුණද 2017 වර්ෂයේදී අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික නැවත ගැලපීම කිරීමෙන් පසු 2013 වර්ෂයේ රු.19,584,159 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු.51,327,517 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව ඇතුළත් කළ යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අයවැය ලේඛනය, ක්‍රියාකාරකම් සැලැස්ම හා අස්මුදල් සැලැස්ම එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශීය භික්ෂු ශිෂ්‍යයන් වැඩි පිරිසක් ලියාපදිංචිවන ඩිප්ලෝමා පාඨමාලා සඳහා පසුගිය වර්ෂයේ ලියාපදිංචිවූ ශිෂ්‍ය සංඛ්‍යාව 296 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 93ක් වූ අතර සියයට 68 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට පර්යේෂණ දීමනා ලෙස රු.2,226,043 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණද ඔවුන් පර්යේෂණ කටයුතුවල යෙදුන බවට හා ඒවායේ ප්‍රගතිය පර්යේෂණ කමිටුව විසින් පරීක්ෂා කළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවූ අතර අවසන් කළ පර්යේෂණවල අවසාන වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව, පර්යේෂණ හා ප්‍රකාශන පොත් ශේෂය 3947 ක් වුවද භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය 3,605 ක් වූයෙන් රු.123,188 ක් වටිනා ප්‍රකාශන 342 ක ඌනතාවයක් පැවතියද එම ඌනතාවය හඳුනාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

### 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු බැංකු ගිණුමක 2017 දෙසැම්බර් 31 දිනට රු.6,653,361 ක ශේෂයක් පැවතුන අතර මෙම ගිණුමෙහි වර්ෂය පුරාම රු.5,367,521 ක සාමාන්‍ය ශේෂයක් පැවතීමෙන් ආයතනයේ අරමුදල් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව අලෙවිය සඳහා පොත් සහ ප්‍රකාශන මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ක් පමණ පැරණි සෙමින් නිකුත්වන පොත් 3258 ක ශේෂයක් පැවතුණි. මින් වර්ෂය තුළදී අලෙවි කළ හා පරිත්‍යාග කළ පොත් සංඛ්‍යාව 347 ක් පමණක් විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්. විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය පාලනය

2017 වර්ෂයේ පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව සත්‍ය අගයන් සහ අයවැයගත අගයන් අතර සියයට 58 සිට සියයට 100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හා වසර 25 ක් පැරණි අබලන් වාහනය කඩිනමින් අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ගබඩා පාලනය | තොග ඌනතා හා අතිරික්තතා ගලපා ගිණුම් නිවැරදි නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | අවශ්‍යතාවය ඉක්මවා වියදම් ඇස්තමේන්තු කිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

113, Dutugemunu Street, Kohuwala. | 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2018-01

ඔබේ අංකය :
Your No :

2018.08.17

ලියාපදිංචි තැපෑල

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017.දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් අංක එච්ඊඩී/බී/පීඅයිපීබීඑස්/1/17 හා 2018.08.09 වැනි දිනැතිව එවා ඇති කෙටුම්පත් වාර්තාවට අදාළ පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) නිරීක්ෂණ නිවැරදි යි.
අදාළ ඉතිරි කිරීමේ ගිණුම යාවත්කාලීන කර ඇති අතර ගිණුම් සටහන තැබීම මඟහැරී ඇත.
2018 වර්ෂයේ දී අදාළ සටහන් තබා ඇත.

(ආ) 2016 වර්ෂයේ අවසන් ගිණුම් විගණනයේ දී පෙන්වා දුන් පරිදි ගිණුම් අංක 086-6001-00032808/086-6001-00032826/086-6001-00001208 යළි සක්‍රීය කිරීමේ පහසුකමේ අගයට අමතරව උපචිත පොලිය සටහන් කර ඇත.
ගිණුම් අංක 086-6001-00032817/086-6001-000110304/-086-6001-000002680 සඳහා ඉහත පරිදි කටයුතු කර ඇතත් ගණනය කිරීම සඳහා වැරදි යළි සක්‍රීය කිරීමේ පත්‍රිකාව යොදා ගැනීම හේතුවෙන් ස්ථාවර තැන්පත් වටිනාකම අඩුවෙන් වීමට හේතු වී ඇත.
2018 වර්ෂයේ දී නිවැරදි සටහන් තැබීමට උපදෙස් ලබා දී ඇත.

(ඇ) නිරීක්ෂණ නිවැරදි යි.
කෙටුම්පත් වාර්තාව සඳහා පිළිතුරු සකස්කරන අවස්ථාව වනවිට 2018 වර්ෂයේ දී නිවැරදි කිරීමේ සටහන තබා තිබුණි. අදාළ ජ'නල සටහනෙහි පිටපතක් ඉදිරිපත් කරන ලදී.

(ඈ) මෙම ප්‍රකාශනකීත විස්තරවල අගය ගිණුම් ශේෂ හි ඇතුළත් කිරීමට ගිණුම් අංකයේ තොරතුරු සහිත සඳහනක නොමැති වීම හේතුවෙන් ගිණුම්ගත කිරීම ප්‍රමාද වී ඇත.

අධ්‍යක්ෂ
Director
011 3132323

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
Senior Assistant Registrar
011 2803322

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
Senior Assistant Bursar
011 5838151

සාමාන්‍ය/General 011 2803321 | ෆැක්ස්/Fax 011 2803322, 011 2809124 | E-mail : pipbs@sltnet.lk, pgipbs@gmail.com

(ඉ) ආයතනයේ මෙතෙක් කල් ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබීම හේතුවෙන් වාර්ෂිකව වෙන්දේසි කළ වත්කම් විකිණීමෙන් ලද මුදල් අවිනිශ්චිත ගිණුමෙහි දක්වා ඇත.

2017 වර්ෂයේ දී අපහරණය කළ වත්කම් පිළිබඳ තොරතුරු, අදාළ ගිණුම් සටහන් සඳහා (පිරිවැය හා සමුච්චිත ක්ෂය) ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් ගිණුම්වලින් ඉවත්කළ නොහැකි වී ඇත.

ඉදිර්යේ දී මෙවන් තත්වයක් උත්ගත නොවන ආකරයට වත්කම් නඩත්තු අපහරණය හා වෙන්දේසි කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය යටතේ ස්ථාවර වත්කම් ලේඛනයෙහි වත්කම් අවසන් ගිණුම් සමඟ ගලපන අවස්ථාවේදී මෙම ශේෂය ද ගැලපීමට අවශ්‍ය කටයුතු කිරීමට නියමිතයි.

### 2.2.2 <u>අවිනිශ්චිත ගිණුම</u>

ආයතනයේ මෙතෙක් කල් ස්ථාවර වත්කම ලේඛනයක් නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ සිදුකරන ලද අබිලි භාණ්ඩ වෙන්දේසිය මගින් කළ වත්කම් විකිණීමෙන් ලද මුදලින් ඉන්වෙන්ටරි ගත භාණ්ඩ හා තොරතුරු අනාවරණය කරගත හැකි ස්ථාවර වත්කම්, ගිණුම් හි ගැලපීමෙන් පසුව ඉතිරි මුදල් මෙසේ අවිනිශ්චිත ගිණුමෙහි දක්වා ඇත.

අපහරණය කළ වත්කම් පිළිබඳ තොරතුරු, අදාළ ගිණුම් සටහන් සඳහා (පිරිවැය හා සමුච්චිත ක්ෂය) ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් ගිණුම්වලින් ඉවත්කළ නොහැකි වී ඇත.

ඉදිරියේ දී මෙවන් තත්වයක් උත්ගත නොවන ආකරයට වත්කම් නඩත්තු අපහරණය හා වෙන්දේසි කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය යටතේ, ස්ථාවර වත්කම් ලේඛනයෙහි වත්කම් අවසන් ගිණුම් සමඟ ගලපන අවස්ථාවේදී මෙම ශේෂය ද ගැලපීමට අවශ්‍ය කටයුතු කිරීමට නියමිතයි.

### 2.2.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

ආයතනය ආරම්භයේ සිටම 2015 වර්ෂයේ සිට මෙතෙක් ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබීණි. ඒ අනුව 2016 සිට ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර අවසන් ගිණුම් සමඟ සංසන්දනය කර රු.3.821.669/- ක වෙනසක් හඳුනාගෙන ඇත.

2016 වස්රේ සිට පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛනය ගිණුම් ප්‍රකාශ සමඟ සංසන්ධනය කර හඳුනාගත් වත්කම් සටහන් නොවීම වත්කම් කාණ්ඩ අතර මාරුවීම යන වැරදි 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ අවසන් ගිණුම් හි නිවැරදි කර ඇත.

ඒ අනුව එම ගැලපීම් අනුව අදාළ සටහන් යාවත්කාලීන කොට තවදුරටත් පවත්නා වෙනස පොත්වලින් ලියා හැරීම සඳහා කටයුතු කරන ලෙස 2017.12.14 දින පැවති විගණන කමිටුව මගින් උපදෙස් දී ඇත. ඒ අනුව කටයුතු කරමින් පවතී.

### 2.3 <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකාරණ තීරණවලට අනුකූල නොවීම</u>

(අ) පෙත්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් කඩිනමින් නිවැරදි කිරීම සිදු කළ අතර පියසභා එක් සාමාජිකයකු පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ආ) පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ දැනුමැති කාර්ය මණ්ඩල සාමාජිකයින් ආයතනයේ සීමිත ශ්‍රම සංඛ්‍යාතිය තුළ නියෝජනය නොවේ. සේවක සංඛ්‍යාති සංශෝධනය කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන මෙම සේවා ලබා ගැනීමට අපේක්ෂිතය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

නිරීක්ෂණ නිවැරදි වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

පෙන්වා දී ඇති කරුණු ද ඇතුළත් කර 2018 වර්ෂය සඳහා සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා ඇතුළත් වීමේ සුදුසුකම 2018 වර්ෂයේදී සංශෝධනය විය. මෙනිසා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට ඇතුළත් වීමට නියමිත වූ ශිෂ්‍යයින් විශාල සංඛ්‍යාවකට සෘජුවම ශාස්ත්‍රපති පාඨමාලාවට ඇතුළත් වීමට අවස්ථාව සැලසුනි. ඒ අනුව සංඛ්‍යාව සංශෝධනය විය.

(ආ) විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මෙ සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන වැඩ පිළිවෙතට ආයතනය ද අනුගතව කටයුතු කරනු ලබයි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කළමනාකාරු මණ්ඩල අනුමැතිය මත පත්කරන ලද කමිටුවක් මගින් අදාළ කටයුතු කරමින් පවතී.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මහා භාණ්ඩාගාරයෙන් ආයතනය වෙත පුනරාවර්තන හා ප්‍රාග්ධන වශයෙන් ලැබෙන මුදල් මෙම බැංකු ගිණුම වෙත ප්‍රේෂණය වේ. තවද ආයතනයේ මාසිකව රුපියල් මිලියන 7ක පමණ මුදලක් සාමාන්‍යයක් වියදම් වශයෙන් වැයවේ. ගිණුමට ඉදිරිපත් නොවූ චෙක්පත් අගය රුපියල් මිලියනයක පමණ මුදලක් සාමාන්‍යයක් ලෙස සඳහන් වේ. මුදල් රෙගුලාසි 387 අනුව රජයේ ගිණුම් මගින් චෙක්පත් ලිවීමේදී ගිණුමෙහි ශේෂය ප්‍රමාණවත්ව තිබීම අනිවාර්ය වේ.

5. <u>තිරසාර සංවර්ධනය</u>

5.1 <u>තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම</u>

(අ) ඉහත අරමුණු කරා ළඟාවීමේ ආරම්භයක් ලෙස විභාග ප්‍රතිඵල, පුරප්පාඩු, දැන්වීම් හා වෙනත් තොරතුරු සංවර්ධනය කරන ලද ආයතනික වෙබ් අඩවියේ පළ කිරීම දැනට ද ආරම්භ ඇත.

6. <u>ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය</u>

6.1 <u>අයවැය පාලනය</u>

අයවැය ලේඛනය උපරිම අයුරින් ඵලදායි ලෙස කළමනාකරණය කර පවත්වාගෙන යාමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී.

7. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) ස්ථාවර වත්කම් පාලනය - ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇත.

(ආ) ගබඩා පාලනය - ඉදිරියේදී අදාළ ගැලපීම් කරනු ලැබේ.

(ඇ) අයවැය පාලනය - මෙම තත්වය වළක්වා ගැනීම පදනම්ව අයවැය පුරෝකථන අවස්ථාවලදී අයවැය පාලනය පිළිබඳව අදාළ අංශ තරයේ දැනුම්වත් කිරීමට දැනට ද පියවර ගෙන ඇත.

ඉහත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම් පිළිබඳව මම පෞද්ගලිකව ම වගවන බව මෙයින් සහතික කරමි.

මෙයට,

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)
113, දුටුගැමුණු වීදිය,
කොහුවල.

පිටපත් : 01. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
02. සභාපති - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව
03 ලේකම් - උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

